# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1979 අංක 19 දරන බැංකු හර බදු (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 20 යි　　　　තැපැල් ගාස්තුව : ශත 25 යි

1979 අංක 19 දරන බැංකු හර බදු (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 95/78.

**1970 අංක 27 දරන බැංකු හර බදු පනත ඉවත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 19 දරන බැංකු හර බදු (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, සියලු කාර්ය සඳහා එය 1979 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය. කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 32 දරන පනතින් සංශෝධිත 1970 අංක 27 දරන බැංකු හර බදු පනත මෙයින් ඉවත් කරනු ලැබේ. 1970 අංක 27 දරන පනත ඉවත් කිරීම.

3. 1970 අංක 27 දරන බැංකු හර බදු පනත ඉවත් කිරීම නොතකා, 1979 ජනවාරි මස 1 වන දිනට පෙර යම් කාලසීමාවක් සම්බන්ධයෙන්, එකී පනත යටතේ ගෙවිය යුතු යම් බද්දක්, එවැනි ඉවත් කිරීමක් නොතිබුණ ලෙස සලකා එකතු කර ගැනීම සහ අය කර ගැනීම කළ හැකි ය. ඉතිරි කිරීම.

ඒ 39976—11,700 (79/01)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.